# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2465/25 – 2025 දෙසැම්බර් මස 06 වැනි සෙනසුරාදා – 2025.12.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/158.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

“ එක් පාර්ශ්වයක් වශයෙන්

1. යූ. ජී. කිරිබණ්ඩා මයා, අංක 18, ඇත නිකතැන්න, වටපාන, පුටුහපුව
2. පී. පෙරියසාමි මයා, 207/01, රංගල පාර, උඩිස්පත්තුව
3. ආර්.එච්. කේ. බණ්ඩා මයා, 243/බී, මැටි දෙණිය, මැද මහනුවර
4. ජී. ඒ. ජී. එස්. ඒකනායක මයා, 12 සී, කොබිල්ලපතන, වටපාන, පුටුහපුව
5. කේ. ජී. නවරත්න මයා, අංක 245/1, වැලේතොට, රඹුක්වැල්ල, තෙල්දෙණිය

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
නො.200,
කිරුළ පාර,
නාරාහේන්පිට

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩාමාදුව, ද විල්ලේජ්, 202/බී/61, නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී.

මගේ අංකය: IR/COM/02/2021/158.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

“ එක් පාර්ශ්වයක් වශයෙන්

1. යූ. ජී. කිරිබණ්ඩා මයා, අංක 18, ඇත නිකතැන්න, වටපාන, පූටුහපුව
2. පී. පෙරියසාමි මයා, 207/01, රංගල පාර, උඩිස්පත්තුව
3. ආර්.එච්. කේ. බණ්ඩා මයා, 243/බී, මැටි දෙණිය, මැද මහනුවර
4. ජී. ඒ. ජී. එස්. ඒකනායක මයා, 12 සී, කොබිල්ලපතන, වටපාන, පූටුහපුව
5. කේ. ජී. නවරත්න මයා, අංක 245/1, වැලේතොට, රඹුක්වැල්ල, තෙල්දෙණිය

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
නො.200,
කිරුළ පාර,
නාරාහේන්පිට.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට
හේතු වී පවත්නා කරුණ වනුයේ

“ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තෙල්දෙණිය ඩිපෝවේ 1983.03.15 සිට 2017.03.26 දින දක්වා සේවය කළ යූ. ජී. කිරිබණ්ඩා මයා 1977.11.07 සිට 2016.07.07 දින දක්වා සේවය කළ පී. පෙරියසාමි මයා, 1986.12.11 සිට 2016.10.30 දින දක්වා සේවය කළ ආර්. එච්. කේ. බණ්ඩා මයා, 1996.09.01 සිට 2017.10.31 දින දක්වා සේවය කළ ජී. ඒ. ජී. එස්. ඒකනායක මයා සහ 1980.11.03 සිට 2017.03.25 දින දක්වා සේවය කළ කේ.ජී. නවරත්න මයා යන අයට 2004 පෙබරවාරි මස සිට 2004 අප්‍රේල් මස දක්වා ලබා දී 2004 මැයි මස සිට අත්හිටුවන ලද වැටුප් වර්ධක නැවත ලබා නොදීමෙන් එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.”

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 12-0028

මගේ අංකය: IR/COM/02/2024/22.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

“ එක් පාර්ශ්වයක් වශයෙන්

1. ජී. එන්. කේ. මුනිදාස මයා, 70/ඒ/2, මුනිසෙවන, බුළුගහපිටිය, ඇහැලියගොඩ
2. පී.ජී. එල්. ජයකොඩි මයා, නො.60/1, මොලමුරේ මාවත,කෑගල්ල
3. ආර්. එම්. එස්. රත්නායක මයා, නො. 151, කැටවල, ලෙවල, මහනුවර

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
අංක 15,
රොක් හවුස් පටුමග,
කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමග, 34/64, ඒ. බී. හේරත් මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී.

මගේ අංකය: IR/COM/02/2024/22.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

“ එක් පාර්ශ්වයක් වශයෙන්

1. ජී. එන්. කේ. මුනිදාස මයා, 70/ඒ/2, මුනිසෙවන, බුළුගහපිටිය, ඇහැලියගොඩ
2. පී.ජී. එල්. ජයකොඩි මයා, නො.60/1, මොලමුරේ මාවත,කෑගල්ල
3. ආර්. එම්. එස්. රත්නායක මයා, නො. 151, කැටවල, ලෙවල, මහනුවර

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,
රොක් හවුස් පටුමග,
කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"වසර 10 ක පමණ කාලයක් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවය කළ ජී. එන්. කේ. මුණිදාස මයා, පී. ජී. එල්. ජයකොඩි මයා සහ ආර්. එම්. එස්. රත්නායක මයා යන සේවකයින්ට පහළ ශ්‍රේණියක සිට ඉහළ ශ්‍රේණියකට උසස්වීම් ලැබීමට හිමිකමක් තිබේ ද යන්නත් එලෙස හිමි නම් හිමි විය යුතු උසස්වීම් නොලැබීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ,
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 12-0029